**මන්නාරම ප්‍රාදේශීය සභාව**

**---------------------------**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**--------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

2018 වර්ෂයේ මූල්‍යප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍යප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට **මන්නාරම** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශය ඉදිරියේදී අනාවරණය වනු ඇති බව මම දනිමි. |

**(ආ) නොසැසඳු ගිණුම්**

**----------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ඇති විවිධ ණයහිමියන්, පිරියත හා උපකරණවල ශේෂය, සටහන්වල සඳහන්ව ඇති ශේෂයන් අතර රු.158,462 ක වෙනසක් පෙන්නුම් කෙරුණි. | අදාළ ශේෂයන්වල වෙනස්කම් සසඳා ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | ගිණුම් වාර්තාවල දෝෂ නිවැරදි කිරීමට හා ඒවාට අනුකූල වීමට පියවර ගනු ලබන අතර අනාගතයේදී එය සිදු නොවේ. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් ගෙවන ලද එකතු කළ අගය මත බදු පිටපත් විගණනයට වාර්තා නොවේ. | විගණනය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය | ඉදිරියේදී එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අංක 16 (2) උපවගන්තිය | සමාලෝචන වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොමැත. | කාලෝචිත ආකාරයකින් විගණනයට වාර්තා ඉදිරිපත් කළ යුතුය | ඉදිරි මූල්‍ය වර්ෂයේදී වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | මුදල් රෙගුලාසි 571 | රු.1,769,914 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු 05 ක් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගත යුතුය. | තැන්පතු 02 ක් ආපසු ගෙන ඇති අතර තැන්පතු 03 ක් සඳහා ඉල්ලීම් ලිපි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබී ඇති අතර කඩිනමින් ඒවා ආපසු ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,153,708 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,896,803 ක් විය.

## 2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

----------------------------------------

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| වසර 15 කට වැඩි කාලයක් සභාව විසින් ආදායම් ලැයිස්තුගත කර නොතිබීම ආදායම් එකතු කිරීමේ අකාර්යක්ෂමතාව හෙළි කරයි. | ආදායම ලැයිස්තුගත කිරීමට සහ ආදායම් එකතු කිරීමට පියවර ගත යුතුය. | K පෝරමය නිකුත් කිරීමට පියවර ගත යුතුය. |

### 2.1.1 වරිපනම් බදු

------------

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| වරිපනම් බද්ද අයකරන ලද වත්කම් වර්තමාන ඇස්තමේන්තු මත පදනම්ව ඇගයීමට ලක් කර නොතිබුණි. තවද, ඒ පිළිබඳ ක්‍රියාකාරකම් සිදු කිරීමේ ප්‍රමාදයක් පවතී. | කාලෝචිත ආකාරයකින් ඇස්තමේන්තු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී තක්සේරු කර අය කිරීමට පියවර ගනු ලැබේ |

### 2.1.2 ආදායම් පරිපාලනය

---------------------

| | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| <u>ආදායම් ප්‍රභවය</u> | <u>ඇස්තමේන්තුගත ආදායම</u> | <u>බිල් කළ ආදායම</u> | <u>රැස් කළ ආදායම</u> | <u>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය</u> | <u>ඇස්තමේන්තුගත ආදායම</u> | <u>බිල් කළ ආදායම</u> | <u>රැස් කළ ආදායම</u> | <u>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය</u> |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වරිපනම් බදු | 526,000 | 239,354 | 163,082 | 808,659 | 415,000 | - | 618,881 | 732,387 |
| බදු කුලී බලපත්‍ර | 9,595,600 | - | 7,952,916 | 2,830,000 | 9,114,600 | - | 9,187,230 | 2,859,583 |
| ගාස්තු | 719,250 | - | 1,445,725 | - | 1,439,500 | - | 1,716,450 | - |
| වෙනත් ආදායම් | 9,228,130 | - | 19,272,883 | 14,337,064 | 8,499,860 | - | 12,113,892 | 23,351,341 |
| එකතුව | **20,068,980** | **239,354** | **28,834,606** | **17,975,723** | **19,468,960** | - | **23,636,453** | **26,943,311** |

* 2017 සඳහා බිල් කළ ආදායම විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත.

**2.1.2 කුලී**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට ලැබිය යුතු මස් කඩ හිඟ කුලී මුදල රු.832400 ක් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි. | කාලෝචිත ආකාරයෙන් ඇස්තමේන්තු කර එය අය කිරීමට පියවර ගත යුතුය. | ඉතිරි මුදල අය කරගැනීමට නීතිමය පියවර ගනු ලැබේ. |
| (ආ ) | සභාවට ලැබිය යුතු වසරකට වැඩි වාහන හිඟ කුලී මුදල රු.877,230 ක් අයකිරීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට පියවර ගත යුතුය. | රු.877,230 ක් වූ ඉතිරි මුදල අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.1.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු උසාවි දඩ මුදල් ශේෂය රු.355,663 කි. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.355.663 ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |

**(ආ ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.10,664,735 ක් විය. | **මුද්දර ගාස්තු** අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු හිඟ මුදල් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 වන දිනැති අංක පොදු/2018/61 දරන විගණන ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධනයට වෙරළාශ්‍රිත සම්පත් ආරක්ෂා කළ යුතු අතර තිරසාර ලෙස දැනුවත් කිරීම් කටයුතු සහ සමුද්‍රීය සහ දූෂණය පාලනය කිරීමේ සැලසුම් කිසිවක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුයි. | ඉදිරි කාලයේදී දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් මහජනතාවට දැනුවත් කිරීමටත් පියවර ගනු ලැබේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව තනතුරු 14 සඳහා සඳහා පුරප්පාඩු පවතින අතර මේ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අදාළ කාල සීමාව තුළ පුරප්පාඩු පිරවිය යුතු අතර වඩා හොඳ සේවාවක් ලබා දීමට පියවර ගත යුතු වේ. | පුරප්පාඩු හේතුවෙන් නියමිත කාලයට බඳවා නොගත් අය බඳවා ගැනීමට පියවර ගෙන තිබේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් 12 ක් වසර විසිපහකට වැඩි කාලයක් තිස්සේ තක්සේරු කර නොමැති අතර ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉඩම් තක්සේරු කර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු වේ. | අදාළ වත්කම් තක්සේරු කිරීමට සහ ඒවා ගිණුම්වලට ගෙන ඒමට කටයුතු කරනු ලැබේ. |

**3.3.2 නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීමට අසමත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව භාරයේ පවතින රු.7,629,000 ක් වටිනා වාහන අටක් මාස 05 සිට අවුරුදු 05 දක්වා කාලයක් තිස්සේ මාස 05 කට වැඩි කාලයක් භාවිතයේ නොතිබූ අතර 2015 ජුලි 07 දිනැති 02/2015 අංක දරන රාජ්‍ය චක්‍රලේඛයට අනුව ඒවා භාවිතයෙන් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වාහන අලුත්වැඩියා කර අදාළ කාල සීමාව තුළ ඒවා භාවිතා කිරීමට පියවර ගත යුතු වේ. | භාවිතා කළ හැකි වාහනය අළුත්වැඩියා කර භාවිතා කරන අතර එම වාහනය අළුත්වැඩියා කිරීමේදී ආර්ථිකමය වශයෙන් භාවිතා කළ හැකි වාහන සඳහා සුදුසු පිළියම් යෙදීමට ද තීරණය කර තිබේ. |

**3.3.3 අත්පත් කර නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරනු ලබන රු.58,074,251 ක් වටිනා වාහන 14 ක අයිතිය **අත්පත් කර** ගෙන නොතිබුණි. | අදාළ කාල සීමාව තුළ වාහන වල අයිතිය ලබා ගැනීමට පියවර ගත යුතුයි. | හිමිකාරිත්වය පැවරීම සඳහා අඛණ්ඩව ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2018 වර්ෂය තුළ අයවැය ගත ව්‍යාපෘති අටක් තුළ රු.1,000,000 ක් වටිනා ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැයගත ව්‍යාපෘති හැකි තරම් අදාළ කාල සීමාව තුළ ක්‍රියාත්මක කළ යුතුය. | පෙර වර්ෂයේ ව්‍යාපෘති 2019 දී ක්‍රියාත්මක කරනු ලැබේ. |

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ කටයුතු විගණනය කර ඵලදායී ලෙස ඒ හා සම්බන්ධ කටයුතු සිදුකිරීමටත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණවල කිසිඳු ප්‍රගතියක් ලබා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාව තහවුරු කිරීමට කටයුතු කළ යුතු වේ. | වැඩිදුර උපදෙස් නිකුත් කර ඇති අතර අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට පියවර ගෙන තිබේ. |